ශීර්ෂය 309 ගොඩනැගිලි දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 309 - ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150, 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) අග්‍රිම ශේෂය

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 07.11 ඡේදය ප්‍රකාරව ඒ.සී.ඒ - 7 ආකෘතියෙහි අග්‍රිම සැසඳුම් ප්‍රකාශය පිළියෙල කළ යුතු වුවත් වෙනත් ආයතන විසින් වාර්තා කරන ආයතනය වෙනුවෙන් එකතු කරන ලද ආදායම වශයෙන් රු.2,736,616 ක් වැරදි ලෙස අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි.	අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ වෙනත් ආයතන වෙනුවෙන් එකතු කරන ලද මුළු මුදල අඩු කිරීම් වශයෙන් රු.283,424,916 ක් වශයෙන් හා එම එකතු කරන ලද මුදලින් ආපසු ගෙවන ලද මුදල රු.2,736,616 ක් මෙම ප්‍රකාශනයට එකතු කිරීම් වශයෙන් දක්වා ඇත. මෙම වටිනාකම් එකිනෙකට ගලපා ගනිමින් මෙම ප්‍රකාශය සකස් කළේ නම් මෙම ගැටලුව ඇති නොවනු ඇත.	ඒ.සී.ඒ - 7 ආකෘතියට අනුව අග්‍රිම සැසඳුම් ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතුය.

(ආ) මූල්‍ය නොවන වත්කම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුව සතු ඉඩම් 18 ක් හා ගොඩනැගිලි 26 ක් සඳහා තක්සේරු වටිනාකම් නොමැතිවීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල (ACA-6 / SA-82) පෙන්නුම් කරන ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.	දෙපාර්තමේන්තුව සතුව ඉඩම් ගොඩනැගිලි විශාල ප්‍රමාණයක් ඇති අතර මෙම ඉඩම් ගොඩනැගිලි සියල්ල තක්සේරු කර නොමැත. මෙම ඉඩම් ගොඩනැගිලි තක්සේරු කිරීම සඳහා පාලන අංශය ක්‍රියාකරන අතර මෙතෙක් තක්සේරු කරන ලද සියලුම ඉඩම් ගොඩනැගිලි වටිනාකම් අප විසින් සිගාස් පද්ධතිය වෙත ඇතුළත් කර ඇත.	දෙපාර්තමේන්තුව සතු ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් තක්සේරු කර සියළු වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

(ඇ) අග්‍රිම කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අග්‍රිම ගිණුම් අංක 67/24 ට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොවූ අග්‍රිම ශේෂය රු.1,764,622 ක් විය. මූල්‍ය ප්‍රකාශනයෙහි ඒසීඒ–3 ආකෘතියෙහි අග්‍රිම නොපිය වීමට හේතු දක්වා නොතිබුණි.	අග්‍රිම ගිණුම් අංක 67/24 2024 වර්ෂයට නිරවුල් නොවූ අග්‍රිම ශේෂය රු.1,764,622 ක් වීමට හේතුව වූයේ පාර්ලිමේන්තු මැතිවරණය සඳහා අවශ්‍ය දීමනා ගෙවීම සඳහා යොදාගත් අත්තිකාරම් මුදල් ශේෂයන් නොපියවීම හේතුවෙන් වන	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඒසීඒ–3 ආකෘතියෙහි අග්‍රිම නොපියවීමට හේතු දැක්විය යුතු අතර නොපියවූ අග්‍රිම පියවීමට

	අතර මූල්‍ය ප්‍රකාශයෙහි ඒසීඒ–3 අකෘතියෙහි අග්‍රිම නොපියවීමට හේතුව අතපසුවීමක් හේතුවෙන් සටහන් කිරීමට නොහැකිවී ඇත.	කටයුතු කළ යුතුය.

(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
i. නිල නිවාස පොරොත්තු ලේඛනය		
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදයේ 4.3.3 වගන්තිය ප්‍රකාරව නිල නිවාස පොරොත්තු ලේඛනයක් යාවත්කාලින කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	නිල නිවාස ලේඛනය නිවැරදිව යාවත්කාලීන කර ඇත.	ආයතන සංග්‍රහය ප්‍රකාරව නිල නිවාස පොරොත්තු ලේඛනය යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බවට

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී නිසි අධ්‍යනයකින් හා සැලකිල්ලකින් තොරව ඇස්තමේන්තු පිළියෙල කිරීම හේතුවෙන් වැය විෂයය අංක 309-1-1-1304 හා වැය විෂයය අංක 309-2-2-1703 ට අදාළව ඇස්තමේන්තු කර තිබුණු පිළිවෙලින් රු.2,000,000 ක් හා රු.100,000 ක ප්‍රතිපාදන උපයෝගී කර නොගැනීම හේතුවෙන්	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය මඟින් අප වෙත යොමු කරන ලද 2023 අප්‍රේල් 28 දිනැති අංක ICTA/DS/LG/2023/FA/01 දරන ලිපිය අනුව සේවාව ලබාගැනීම හෝ පවත්වාගෙනයාම සඳහා (Future support after the warranty expires) ප්‍රතිපාදන ඉල්ලුම් කළ ද ආයතනය මගින් ඔවුන්ගේ සේවා කාලය තවදුරටත් දීර්ඝ කිරීම හේතුවෙන් 309-1-1-1304 වැය විෂයෙන්	නිසි අධ්‍යනයකින් යුතුව වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර වෙන් කරන ලද ප්‍රතිපාදන ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගත යුතුය.

	මුළු ප්‍රතිපාදනයම ඉතිරිව පැවතුණි.	ගෙවීමක් සිදු කිරීමට අවශ්‍ය නොවූ අතර දෙවන භාෂා ප්‍රවීණතා පුහුණු වැඩසටහන් පැවැත්වීමට තරම් ප්‍රමාණවත් රාජ්‍ය නිලධාරීන් සංඛ්‍යාවක් නොසිටි බැවින් 309-2-2-1703 ප්‍රතිපාදන ඉතිරිවී ඇත.	
(ආ)	ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී නිසි අධ්‍යනයකින් හා සැලැස්මකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් වැය විෂයයන් 04 ක සියයට 55 සිට සියයට 83 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීම් සිදුව තිබුණි.	ඇස්තමේන්තු කරන ලද නිලධාරීන් ප්‍රමාණයට බැංකුවලින් දේපල ණය ලබා දීම තව දුරටත් ආරම්භ නොකිරීම හා 2024 වර්ෂයේදී දේපල ණය ලබා ගෙන තිබූ නිලධාරීන් අතරින් කිහිප දෙනෙකු ස්ථාන මාරු ලබා පිටව යාම, 2024 වර්ෂයේ රාජ්‍ය වියදම් කළමනාකරණය මඟින් විදේශ ගමන් වියදම් ඇතුළු අංශ ගණනාවක වියදම් පාලනයක් ඇති කර තිබීම හේතුවෙන් විදේශ පුහුණු වැඩසටහන් සීමා වීම සහ කලාප කාර්යාලවල අවශ්‍යතා සඳහා යොදා ගනු ලබන වෙනත් ආයතනවල වාහන සඳහා ඉන්ධන හා වෙනත් සුළු ඉන්ධන අවශ්‍යතා අවම වීම මේ සඳහා හේතු වී ඇත.	වැය විෂයයන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නිවැරදිව සැලසුම් කර හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූල්‍ය ප්‍රකාශනයෙහි බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි වැය විෂයය අංක 309-1-1-1301 හා 309-2-2-1301 ට අදාළව පිළිවෙලින් රු.81,270 ක් හා රු.300,536 ක බැරකම් දක්වා නොතිබුණි.	අදාළ රථවල සේවා කිරීම් හා අලුත්වැඩියාවන් නිසි පරිදි සිදුකිරීම සිදුවූ බැවින් අදාළ වර්ෂය සඳහා වූ ප්‍රතිපාදන අවසන් වුවද, රාජකාරී සඳහා වාහන භාවිතා කිරීම සිදු කරන අතර, දිගින් දිගටම වාහන අලුත්වැඩියා වැය විෂය කටයුතු සිදුකරමින් පවතින බැවින් මෙම වටිනාකම් බැරකම් හා බැඳීම්වලදී සලකා බලා නොමැත.	බැඳීම් හා බැරකම් ප්‍රකාශයෙහි බැරකම් නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතුය.
(ආ)	මුදල් රෙගුලාසි සංග්‍රහයේ 94(1) රෙගුලාසිය ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට නොබැඳී සිටිය යුතු බව දක්වා ඇතත් නිසි අධ්‍යනයකින් හා සැලසුමකින් තොරව ඇස්තමේන්තු සැකසීම නිසා වැය විෂයය අංක 309-1-1-1301 හි ඉතිරි ප්‍රතිපාදනය වූ රු.1,527 ක් ඉක්මවා රු.79,743 ක බැරකම්වලට එළඹ තිබුණි.	දිගින් දිගට සේවාවන් සපයනු ලබන 309-01-01-1301 හි ප්‍රතිපාදන ඉක්මවා කටයුතු කිරීමක්වී නොමැත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට නොබැඳිය යුතු අතර ප්‍රතිපාදන ඉක්මවීම් අදාළ නීතිරීති ප්‍රකාරව අනුමත කරවාගත යුතුය.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම		
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි අංක 1645	-	වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.	වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීන කිරීමට විෂය භාර නිලධාරි වෙත උපදෙස් ලබාදී ඇති අතර, ඒ අනුව යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 8.8.1. (අ)	-	අසාර්ථක වූ ලංසුකරුවන් වෙත විශේෂ අඩු පාඩු පෙන්නුම් කරමින් ලංසුව අසාර්ථක වීමට බලපෑ හේතු දැනුම් දී නොතිබුණි.	ලංසුව අසාර්ථකවීමට බලපෑ හේතු දැනුම් දීම 2025 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ලංසුව අසාර්ථක වීමට බලපාන ලද හේතු දැනුම් දීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 30/2016 දරන චක්‍රලේඛය	-	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින් පසුව හෝ කි.මී. 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන	යාන්ත්‍රික අංශයේද සහාය ඇතිව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ වාහනවල ඉන්ධන දහන පරීක්ෂාව සිදුකරනු ලබයි. වාහන අලුත්වැඩියා කර අදාළ දුර ප්‍රමාණය සම්පූර්ණ වූ පසු ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර ඇත.	චක්‍රලේඛය ප්‍රකාරව වාහනවල ඉන්ධන පරීක්ෂාවන් කිරීමට කටයුතු කළ යුතුය.

		පරික්ෂාවක් කළ යුතු වුවද ඒ අනුව වාහනවල ඉන්ධන පරික්ෂාවක් සිදු කර නොතිබුණි.	

3.4 තැන්පත් ශේෂයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මු.රෙ. 571(2) ප්‍රකාරව ඉකුත් වූ සියළු තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවත් අංක 6000-0-0-16-033 දරන තැන්පතු ගිණුමට අදාළ 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ රු.12,140,274 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.	ඇතැම් තැන්පතු ශේෂ ඉදිකිරීම්වල අඩුපාඩු නිවැරදි කර නොතිබීම නිසා රාජ්‍ය ආදායමට බැරකිරීමට නොහැකි විය. රඳවා ගැනීම් මුදල් ඉල්ලුම් නොකළහොත් ඉදිරියේදී ආදායමට බැර කිරීමට කටයුතු කරනු ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉකුත් වූ තැන්පතු සම්බන්ධව නොපමාව කටයුතු කළ යුතුය.
(ආ)	මු.රෙ. 571(3) ප්‍රකාරව තැන්පත් ගිණුමක අවිනිශ්චිතව තබා ගෙන ඇති මුදල් ඉකුත් වූ තැන්පතු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉඩ නොතබා අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට, රජයේ ආදායමට බැර කිරීමට හෝ නැතහොත් හැකි ඉක්මනින් ආපසු ගෙවීමට කටයුතු කළ යුතු වුවත් ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා තැන්පතු වශයෙන් 2020 සහ 2021 වර්ෂවල ලැබී තිබූ රු.31,228,168 ක මුදලක් පොදු තැන්පත් ගිණුමෙහි තැන්පත් කර තිබුණි.	බොහොමයක් ව්‍යාපෘති විවිධ හේතූන් නිසා සම්පූර්ණ කර ගැනීමට නොහැකි වීම නිසා ඉකුත් තැන්පතු වශයෙන් සළකා කටයුතු කිරීමට නොහැකිව ඇත. තවද, රාජ්‍ය ආදායමට බැර කර නැවත ඉල්ලීම් හැකිතාක් වැළැක්වීමේ අරමුණින් රාජ්‍ය ආදායමට බැර කිරීමට පෙර තව දුරටත් විමසීම් කරනු ඇත.	යම් අරමුණක් වෙනුවෙන් තැන්පත් ගිණුමේ රඳවාගත් තැන්පතු අදාළ කාර්යය සඳහා යෙදවිය යුතු අතර මුදල් රෙගුලාසි ප්‍රකාරව තැන්පතු නිරවුල් කිරීමටද කටයුතු කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් රෙගුලාසි 787 ප්‍රකාරව සාමාන්‍ය නියමය වනුයේ රජයේ සියළුම නිර්මාණ හා වැඩ ක්‍රියාත්මක කිරීම පිළිබඳව රජයේ වැඩ දෙපාර්තමේන්තුව එනම් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වගකිව යුතු බවයි. මෙම කාර්යයන් හා අනෙකුත් ඉදිකිරීම් කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව සතුව 2024 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම්	බද්ද නිවාස අයිතිවාසිකම් පනතෙහි වලංගු කාලය 2023 අගෝස්තු 18 දිනෙන් අවසන්වන අතර එම කාලය දක්වා ලැබුණු ඉල්ලීම් ප්‍රමාණය වන 2352 න් 2302 කට සහතික ලබාදී අදාළ ආයතන වෙත යවා ඇති අතර Sonders Place නිවාස සංකීර්ණයෙහි පමණක්, වසා ඇති නිවාස පරීක්ෂාව සම්පූර්ණ කර නිවාස 50 ක් සඳහා වාර්තා ලබාදීමට නොහැකි වී ඇත.	ඉතිරි නිවාස ද පරික්ෂා කර සහතික ලබා දීම සඳහා කඩිනමින් සුදුසු පියවර ගත යුතුය.

ක්ෂේත්‍රයට අදාළ ජොෂ්ඨ මට්ටමේ ඉංජිනේරුවන් 70 කින්ද, ජොෂ්ඨ මට්ටමේ ගෘහ නිර්මාණ ශිල්පීන් 14 ක්ද ඇතුළුව සැලසුම් ශිල්පීන් හා තාක්ෂණික නිලධාරීන් 105 කින් සමන්විත කාර්ය මණ්ඩලයක් අනුයුක්තව සිටිය ද කාර්යසාධනය දුර්වල තත්ත්වයක පැවතුණි. 2018 අගෝස්තු 15 දිනැති 2018 අංක 23 දරන බද්ද නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනතෙහි 3.(3)(1) උපවගන්තිය ප්‍රකාරව සහාධිපත්‍ය දේපළ ලියාපදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික කරමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලිඛිත ප්‍රකාශයක් එම සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කරන අවස්ථාවේදී නිකුත් කළ යුතුය. මෙම පනත ආරම්භ වන දින සිට වසර පහක කාලසීමාවක් සඳහා ක්‍රියාත්මක විය යුතු බව පනතෙහි 2 වන වගන්තිය මගින් දක්වා තිබුණු අතර 2023 අගෝස්තු 18 දින වන විට එම කාල සීමාව අවසන් වී තිබූ අතර දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මකවීමේ ප්‍රමාදය හේතුවෙන් මෙම ක්‍රියාදාමය සම්පූර්ණ කර නොතිබුණි.

4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) මන්නාරම මඩු දේවස්ථාන පරිශ්‍රය සංක්‍රමණ නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතිය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
i.	මඩු වන්දනා සමය සඳහා පැමිණෙන බැතිමතුන් හට අඩු පිරිවැයකට නිවාස 300 ක් ඉදිකිරීම් සඳහා 2018 නොවැම්බර් 15 දින රු.මිලියන 300 ක් ඉන්දියානු රජයේ ආධාර යටතේ ලබාගෙන තිබුණි. මෙම ව්‍යාපෘතියේ උපදේශක ලෙස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව පත්කර තිබූ අතර සංචාරක	ගොඩනැගිලි ඉදිකරනු ලබන භූමියේ ජලය රැඳී තිබීම තාවකාලිකව සිදුවන අපහසුතාවයක් වන අතර වැඩ බිමෙහි වැඩි ජලය අපවහනය වන ස්වාභාවික මාර්ග ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය හා අනෙකුත් අපද්‍රව්‍ය ගොඩගසා තිබීමෙන් අවහිරව පැවතීම මෙයට මූලිකව බලපා ඇත.	භූමිය පරීක්ෂා කර ඊට ගැලපෙන පරිදි ගොඩනැගිලි සැලසුම් සකස් කිරීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් පියවර ගත යුතුය.

	සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කොට තිබුණි. ගොඩනැගිලි ඉදිකරනු ලබන භූමිය ජලය රැඳෙන මඩ සහිත භූමියක් බව නිරීක්ෂණය වූ අතර ඉදිකිරීම් කිරීමට පෙර භූමිය පරීක්ෂා කළ බවට වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. මුල් සැලසුම ප්‍රකාරව නිවාස ඒකක 300 ක් නිවාස 12 කින් යුත් දෙමහල් ගොඩනැගිලි 25 ක් ලෙස නිම කිරීමට සැලසුම් කර තිබුණද පසුව එය තනි මහල් ලෙස වැඩ නිම කිරීමට එකඟ වීම හේතුවෙන් මුලින් වැඩ ආරම්භ කර තිබූ නිවාස සඳහා යෙදූ අත්තිවාරම් වෙනුවෙන් අනවශ්‍ය වැය බරක් දරා තිබුණි.	නිම කර තිබූ දෙමහල් ගොඩනැගිලි අත්තිවාරම් මත තනිමහල් ගොඩනැගිලි ඉදිකිරීමට සිදු වීමෙන් සිදුවන අනවශ්‍ය වැය බර සේවාදායකයාගේ දැනුවත් වීම මත ඔවුන්ගේ ඉල්ලීම මත සිදු වේ.	
ii.	අමුද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ හා ශ්‍රමය ප්‍රමාණවත් පරිදි සපයා නොගැනීමෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට එකඟ වූ පරිදි ව්‍යාපෘතිය නිම කර දීමට නොහැකි මට්ටමක පැවති බව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සේවාලාභී ආයතනය වන අදාළ අමාත්‍යාංශය දැනුවත් කර තිබුණද ඒ සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.	නියමිත වූ 2024 දෙසැම්බර් 31 වන දිනට මෙම ව්‍යාපෘතිය නිම කිරීමට නොහැකි වන බවට අදාළ දැනුවත් වීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු (කලාප 02) විසින් නිසි පරිදි අදාළ සියළු ආයතන වෙත දන්වා තිබූ අතර ඉන් ඉදිරියට ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු නොවීම මෙම දෙපාර්තමේන්තුවේ පාලනයෙන් තොර කටයුත්තක් වනු ඇත.	කොන්ත්‍රාත්කරු දැනුවත් කර නියමිත කාල සීමාව තුළ ව්‍යාපෘතිය නිම කර ගැනීමට මෙන්ම ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට පියවර ගත යුතුය.
iii.	භෞතික පරීක්ෂාවේදී වැඩ බිමෙහි පස් සෝදා සකස් කරගත් වැලි ගොඩනැගිලි ඉදිකිරීම සඳහා හා සිමෙන්ති ගල් සෑදීම සඳහා යොදා ගෙන තිබුණි.	වැඩ බිමෙහි පවතින ස්වාභාවික පස මඩ සහිත පසක් වේ. එම පස කිසිසේත්ම සිමෙන්ති ගල් සෑදීම සඳහා අමුද්‍රව්‍ය ලෙස යොදා ගත නොහැක. සිමෙන්ති ගල් නිපදවීම සඳහා මෙම දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද ගංගා වැලි පමණක් යොදාගෙන ඇත.	ප්‍රමිතියෙන් තොර ඉදිකිරීම් ද්‍රව්‍ය භාවිතා කරන්නේද යන්න නිතිපතා අධීක්ෂණය කළ යුතු අතර ඉදිකිරීම්වල ගුණත්වය වැඩිකර ගැනීමට පියවර ගත යුතුය.
iv.	2024 මාර්තු 09 දින යාපනය විශ්වවිද්‍යාලයේ රසායනාගාරයක් මඟින් සිදු කළ පරීක්ෂාවේදී, ඉදිකිරීම් සඳහා යොදා ගන්නා මෙම කුහර සහිත සිමෙන්ති ගල්වල තිබිය යුතු සම්පීඩණ ශක්තිය නොමැති බව තහවුරු කර තිබුණි. ඒ අනුව මෙම ගල් යොදා ඉදිකිරීම් කරනු ලැබූ	වැඩ බිමෙහි බිත්ති බැඳීම සඳහා සිමෙන්ති ගල් නිෂ්පාදනය කිරීමේ මූලික අවධියේදී ඒ සඳහා සුදුසු වැලි හා සිමෙන්ති මිශ්‍රණ අනුපාත කිහිපයක් අත්හදා බලන ලදි. එහිදී පරීක්ෂා සාම්පල ලෙස සාදන ලද එක් මිශ්‍රණයක් අඩංගු ගල් සාම්පලයක් යාපනය විශ්ව විද්‍යාලය මඟින් පරීක්ෂා කර අවශ්‍ය සම්පීඩණ ශක්තිය නොමැති නිසා එම සාම්පලයේ අඩංගු ගල් සියල්ල	ඉදිකිරීම් සඳහා අනුමත ප්‍රමිතියෙන් යුත් සිමෙන්ති ගල් භාවිතා කරන්නේද යන්න තහවුරු කර ගත යුතු අතර රසායනාගාර පරීක්ෂාවෙන් අනුමත නොවූ ද්‍රව්‍ය යෙදීම පිළිබඳව කටයුතු කළ

	ගොඩනැගිලි නියමිත ප්‍රමිතියෙන් නොපවතින බව නිරීක්ෂණය විය.	ඉවත් කරන ලද අතර මිශ්‍රණ අනුපාතය වෙනස් කර නැවත පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම සමත් වූ මිශ්‍රණ අනුපාතයට සිමෙන්ති ගල් නිපදවීම සිදු කර ඇති අතර එම ගල් යොදා නිවාස ඉදිකර ඇත.	යුතුය.
v.	ප්‍රාදේශීය ලේකම්ගේ මැදිහත් වීමෙන් ප්‍රමාණවත් වැලි තොග කොන්ත්‍රාත්කරු වෙත ලබා දෙන බවට දන්වා තිබුණද එලෙස ලබා දුන් වැලි තොග මෙම ඉදිකිරීම් වෙනුවෙන් යොදවා ගෙන නොතිබුණු බව විගණනයට නිරීක්ෂණය විය.	ප්‍රාදේශීය ලේකම් මැදිහත් වීමෙන් වැලි කැනීම සඳහා අවසර පත් ලබා දුන්නද ඉදිකිරීම සඳහා අවශ්‍ය පමණ වැලි සැපයීමක් නොතිබුණි. සම්මත මිලට අමතරව වැඩි මුදලකට වැලි ලබා ගැනීමට කොන්ත්‍රාත්කරු වෙත ස්ථාවර මූල්‍ය ප්‍රවාහයක් නොතිබීම මෙයට හේතු වී ඇත.	ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සුදුසු ප්‍රමිතියෙන් යුත් වැලි භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.
vi.	භෞතික විගණන පරීක්ෂාවේදී නිවාස 08 කින් යුත් ගොඩනැගිලි ඒකක 04 ක් ලින්ටල් මට්ටම දක්වා බිත්ති බැඳ තිබූ අතර ඉතිරි ගොඩනැගිලිවල අත්තිවාරම් පමණක් යොදා තිබුණු බව දක්නට විය. අවබෝධතා ගිවිසුම පරිදි 2024 දෙසැම්බර් 05 විගණිත දිනයවන විටත් පූර්ණ කාලීනව යෙදවිය යුතු කාර්ය මණ්ඩලය සහ පුහුණු ශ්‍රමිකයන් වැඩ බිමට යොදවා නොතිබූ බව විගණනයට නිරීක්ෂණය විය. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 23 ක් හා සියයට 47 ක් විය.	පැවති අයහපත් කාළගුණික තත්ත්වය හා නියමිත පරිදි අමුද්‍රව්‍ය හා ශ්‍රමය වැඩ බිම වෙත ලබා දීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වීම යන කරුණු මත මෙම වැඩ බිමෙහි ප්‍රගතිය නියමිත පරිදි නොවූ බව සත්‍යයකි. කෙසේ වෙතත් ගෙවීමක් සිදුකර ආරක්ෂක අමාත්‍යාංශය මඟින් හමුදා ශ්‍රමය ලබා ගැනීම සඳහා නිර්දේශයක් සහිතව අවශ්‍ය කටයුතු මෙම දෙපාර්තමේන්තුව හා අමාත්‍යාංශය මඟින් ඉටුකර දී ඇත.	කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව කොන්ත්‍රාත්කරු මෙහෙයවා ඉදිකිරීම් අවසන් කරවා ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ) තල් ආදර්ශ ගොවිපලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
i.	තල් කර්මාන්තය විවිධාංගීකරණය කරමින් සංචාරක මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීමට හා තල් ආදර්ශ ගොවිපලක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට තල් සංවර්ධන මණ්ඩලය උපදේශන ආයතනය ලෙස 2021 මාර්තු 31 දින ගොඩනැගිලි දෙපාර්තමේන්තුව තෝරාගෙන තිබුණි. ව්‍යාපෘතිය ඉදිකිරීමට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තුව රු.18,029,000 ක් වූ නමුත් ව්‍යාපෘතිය සඳහා ලංසු	ඉංජිනේරු ඇස්තමේන්තුව අනුව ව්‍යාපෘතිය සඳහා වූ වැඩ වටිනාකම රු.18,029,000 ක් වේ. එහි මුළු පිරිවැය ඇස්තමේන්තුව (අවිනිශ්චිත වෙන් කිරීම් ආදිය ඇතුළුව) රු.22,999,000 කි. පුවත්පත් දැන්වීමෙහි වැරදීමකින් මෙය රුපියල් මිලියන 23 ක් ලෙස සටහන්ව තිබිණි. මෙම වැරදීම් වළකා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනු ඇත.	ලංසු කැඳවීමේදී ව්‍යාපෘතිවල ඇස්තමේන්තු වටිනාකම් නිවැරදිව හා පරීක්ෂා කර දැක්වීමට කටයුතු කළ යුතුය.

	කැඳවීමේ පුවත්පත් දැන්වීමෙහි ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 23 ක් ලෙස දක්වා තිබුණි.		
ii.	ලංසුකරුවන් දෙදෙනෙකු පමණක් ලංසු ඉදිරිපත් කරන ලද අතර තෝරා ගනු ලැබූ ලංසුකරුගේ ලංසු වටිනාකම ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 21.75 කින් වැඩි වුවද පසුව සාකච්ඡා කොට එම වෙනස සියයට 9.58 දක්වා අඩු කොට ගෙන තිබුණු අතර නව කොන්ත්‍රාත් වටිනාකම රු.19,756,132 ක් විය. 2021 ජූලි 26 දින ප්‍රධාන ඉංජිනේරු කලාප අංක 06 විසින් අධ්‍යක්ෂ (ඉංජිනේරු සැලසුම්) වෙතින් වාස්තු විද්‍යාත්මක, ව්‍යුහාත්මක, විද්‍යුත් සහ ජල සැපයුම් සඳහා සැලසුම් ලබා දෙන ලෙස ඉල්ලා තිබුණත් 2021 නොවැම්බර් 03 දින වන විටත් අදාළ සැලසුම් ලබා නොදීම හේතුවෙන් ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර නොතිබුණි.	කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ දින සිට දින 14 ක් තුළ කොන්ත්‍රාත්කරුට වැඩ ආරම්භ කළ හැක. ඒ අනුව අදාළ කාලය තුළ කොන්ත්‍රාත්කරු වැඩ ආරම්භ කරන ලදි. 2021 නොවැම්බර් 03 දින වන විට සමහර සැලසුම් ලැබී නොතිබීම වැඩ ඇරඹීමට බාධාවක් නොවිය. විදුලි ඉංජිනේරුමය සැලසුම් ආදිය මෙවන් ව්‍යාපෘතියක වැඩ ආරම්භ කරන අවස්ථාවේ අවශ්‍ය නොවන අතර එම සැලසුම් අදාළ කාල සීමාවේදී නිකුත් කිරීම සාමාන්‍ය පරිපාටිය වනු ඇත.	ව්‍යාපෘතිය ඉදිකිරීමට අවශ්‍ය ඉංජිනේරු සැලසුම් නියමිත දිනවලට අප්‍රමාදව ලබා දීමට කටයුතු කළ යුතුය.
iii.	2021 නොවැම්බර් 23 දෙපාර්තමේන්තුව සහ කොන්ත්‍රාත්කරු අතර ගිවිසුම් අත්සන් කර තිබුණද ප්‍රතිග්‍රහණ ලිපිය අනුව ගිවිසුම් අත්සන් කිරීමට පෙර කාර්ය සාධන සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණි.	ගිවිසුම අත්සන් කිරීමට පෙර කාර්යය සාධන ඇපකරයක් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලදි. එදිනම ගිවිසුම් අත්සන් කිරීමට අවශ්‍ය ලේඛනද නිමකර තිබූ බැවින් ද, කොරෝනා වසංගත සමය තුළ නිලධාරීන්ගේ පැමිණීමද සීමාසහිතව සිදුවූ බැවින්ද ගිවිසුම අත්සන් කිරීම, දෝෂ සහිත පළමු කාර්ය සාධන ඇපකරය ලබාදුන් දිනම සිදු කරන ලදි. දෝෂ නිවැරදි කරන ලද කාර්යසාධන ඇපකරය 2021 දෙසැම්බර් 15 දින අප වෙත ලබා දී ඇත.	ගිවිසුම් අත්සන් කිරීමට පෙර නිවැරදි කාර්යසාධන සුරක්ෂණයන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
iv.	2022 ජූලි 12 දින සිට කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතිය ඉදිකිරීම් අතහැර තිබූ අතර 2022 අගෝස්තු 15 දින වන විට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 30 ක් බව කලාප අංක 06 හි ප්‍රධාන ඉංජිනේරු විසින් වාර්තා කර තිබුණි. ඒ වන විට ව්‍යාපෘතියේ සහතික කළ වැඩ	කොන්ත්‍රාත්කරුගේ වැඩ අත්හිටුවීමෙන් පසු (termination) ඉතිරි වැඩ සඳහා නව ඇස්තමේන්තුවක් සාදා එම ඇස්තමේන්තුවට අනුමැතිය හා අවශ්‍ය ඉතිරි ප්‍රතිපාදන මුදාහරින ලෙස සේවාදායක ආයතනය දැනුවත් කරන ලදි. දිගින් දිගටම එම ඉල්ලීම් සිදු කළද සේවාදායක ආයතනයෙන් නිසි	නව කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන ව්‍යාපෘති ඉදිකිරීම් නැවත ආරම්භ කර සිදු වූ පාඩුව අවම කර ගැනීමට කටයුතු කළ යුතුය.

	වටිනාකම රු.4,964,868 ක් ව තිබූ බවත් නැවත ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් අනතුරුව නව කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන ව්‍යාපෘතිය නිම කිරීමට බලාපොරොත්තු වන බව අංක 2-3-14-382 හා 2022 ඔක්තෝබර් 19 දිනැති ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ට දන්වා තිබුණ ද 2024 සැප්තැම්බර් 02 දින දක්වාම ව්‍යාපෘතියේ කටයුතු නැවත ආරම්භ කර නොතිබුණි.	ප්‍රතිචාරයක් නොලැබුණි. එමෙන්ම ඒ වන විට සිදුකර තිබූ ඉදිකිරීම් ආරක්ෂා කිරීම සඳහා පමණක් ඇස්තමේන්තුවක් පිළියෙල කළ නමුත් ඒ සඳහා ද අනුමැතියක් නොලැබුණි. එබැවින් මෙම ව්‍යාපෘතියේ කටයුතු නැවත ආරම්භ කර නොමැත.	
v.	ව්‍යාපෘතිය ඉදිකිරීම් සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලබා දී තිබූ මුදලින් 2022 සැප්තැම්බර් 30 දින වන විට අත ඉතිරි මුදල් ලෙස රු.12,677,762 ක මුදලක් පැවති අතර මෙම මුදල් විගණිත දිනය වූ 2024 සැප්තැම්බර් 02 දින දක්වාම දෙපාර්තමේන්තු තැන්පත් ගිණුමෙහි රඳවා තිබුණි.	මෙම මුදල වෙනත් ව්‍යාපෘති දෙකක හිඟ මුදල් පියවීම පිණිස සේවාදායක ආයතනය මඟින් වෙන්කර ඇත.	වර්ෂ 02 කට වැඩි කාලයක් තැන්පත් ගිණුමේ රඳවා ඇති මුදල් අප්‍රමාදව ඵලදායීව අදාළ ව්‍යාපෘතියේ හෝ නීතිරීති වලට අනුකූලව වෙනත් ව්‍යාපෘතියක යෙදවීමට කටයුතු කළ යුතුය.

(ඇ) කොළඹ නාගරික රථවාහන ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
i.	කැබිනට් පත්‍රිකා අංක 16/1676/702/003-XXVII සහ 2016 අගෝස්තු 18 දිනැති කැබිනට් තීරණ අංක 10/08/2016/10 මගින් ශ්‍රී ලංකා පොලිසියේ ගොඩනැගිලි ඉදිකිරීම් හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිවලින් කොටසක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පැවරීම යටතේ නාගරික රථවාහන ගොඩනැගිල්ල ඉදිකිරීම් ව්‍යාපෘතියෙහි කළමනාකරණ කටයුතු සිදු කිරීම් සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත භාර දී තිබුණි. ඉදිකිරීම් සඳහා වූ මුළු ඇස්තමේන්තු පිරිවැය රු.376,587,327 ක් විය. ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය මත මෙහි ප්‍රසම්පාදන කටයුතු සිදු කොට තිබුණු අතර එක් කොන්ත්‍රාත් ආයතනයක් පමණක් රු.416,589,070 ක ලංසුවක් ඉදිරිපත් කර තිබුණි. 2017 මාර්තු මාසයේ කොන්ත්‍රාත්කරු සමඟ ප්‍රසම්පාදන කමිටු සාකච්ඡා පවත්වා තිබුණු අතර ලන්සු ඉදිරිපත් කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ නිර්ණායකයක් ලෙස C2 ශ්‍රේණිය හෝ ඊට ඉහළ සුදුසුකමක් වූ අතර එය කොන්ත්‍රාත්තුව පිරිනමන අවස්ථාවේදීත් වලංගු විය යුතු බවට සඳහන් කොට තිබුණද කොන්ත්‍රාත් ආයතනය සතුව CS2 ශ්‍රේණිය 2017 පෙබරවාරි 18 දක්වා පමණක් වලංගු බවට තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවෙහි සඳහන් කොට තිබුණි. එනමුත් ව්‍යාපෘතිය කොන්ත්‍රාත්කරු වෙත පිරිනමා තිබුණේ ඉහත සුදුසුකම් වලංගු කාලය ඉක්ම වූ 2017 සැප්තැම්බර් 15 දිනය. කෙසේ වෙතත් රුපියල් මිලියන 376 ක කොන්ත්‍රාත් වටිනාකමකින් යුත් මෙම ව්‍යාපෘතිය අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබූ ප්‍රසම්පාදන කමිටු සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව මගින්	මෙම ලංසු කැඳවීම අමාත්‍යාංශය මගින් සිදු කළ අතර ලංසු ඇගයීම අමාත්‍යාංශය පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටුවක් මගින් සිදු කරන ලදි. තවද එහි ලංසු ප්‍රදානය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත හා අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය යටතේ අදාළ ලංසුකරු වෙත ප්‍රදානය කර තිබුණි. එම තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව හෝ ප්‍රසම්පාදන අනුමැතියෙහි අඩංගු කරුණු පිළිබඳ විමසුමක් තාක්ෂණික ඇගයීම් කමිටුවෙන් සිදු කිරීමට ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් වෙත බලය පැවරී නැත. එබැවින් තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය පිළිබඳ ගැටළුව යොමු කළ යුතුව ඇත්තේ ඒ පිළිබඳ විමසීම් කිරීමට හා එම පත්කිරීම් සිදු කරන ලද අමාත්‍යාංශය වෙත වනු ඇත.	ලංසු ලේඛනවල ඇතුළත් නිර්ණායක සහ සුදුසුකම් සපුරාලන කොන්ත්‍රාත්කරුවන් වෙත පමණක් ඉදිකිරීම් ව්‍යාපෘති ප්‍රදානය කළ යුතු අතර එසේ නොවන අවස්ථාවන් සඳහා වගකිව යුතු නිලධාරින්ට විරුද්ධව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය.

	අවම සුදුසුකම් සපුරා නොතිබුණු ඉහත කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදානය කිරීමට නිර්දේශ කර තිබුණි.		
ii.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12.2 අනුව සමාන කොන්ත්‍රාත් පිළිබඳව ලංසුකරුවන්ගේ පළපුරුද්ද සහ අතීත කාර්ය සාධනය, මූල්‍ය සම්පත් සහ ගිවිසුම සාර්ථක ලෙස ඉටු කිරීම සඳහා ලංසුකරුවන් වෙත ඇති හැකියාව සහ සම්පත් පූර්ව සුදුසුකම් පරික්ෂා කිරීමේ උපමාන ලෙස දක්වා ඇතත් මෙම ලංසු ඇගයුම් ක්‍රියාවලියේදී ඒ පිළිබඳව සැලකිල්ලට ගත් බවට සාක්ෂි විගණනයට අනාවරණය නොවිය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12.2 අනුව ගිවිසුම සාර්ථක ලෙස නිම කිරීම සඳහා ලංසුකරුවන් වෙත ඇති හැකියාව සහ සම්පත් පිළිබඳ පූර්ව සුදුසුකම් පරික්ෂා කිරීමේ උපමාන ලෙස දක්වා ඇති ලංසුකරුවන්ගේ පළපුරුද්ද හා අතීත කාර්යසාධනය, මූල්‍ය සම්පත් ආදිය පරික්ෂා කරනු ලබන්නේ තාක්ෂණික ඇගයීම් කමිටුව මඟිනි. අමාත්‍යාංශය මඟින් මෙම කාර්ය සඳහා පත් කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුව ප්‍රශ්න කිරීමට හෝ එම තීරණ පිළිබඳ කරුණු පැහැදිලි කර ගැනීමට බලතල ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් වෙත නොමැත. එබැවින් ඒ පිළිබඳව බලතල ඇති ආයතන වෙත මෙම ගැටළුව යොමුකළ යුතු බව ගොඩනැගිලි	කොන්ත්‍රාත් ප්‍රදානයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි කොන්ත්‍රාත්කරුවන්ගේ පූර්ව සුදුසුකම් පරික්ෂා කිරීමේ උපමාන පිළිබඳව සලකා කටයුතු කළ යුතුය.

		දෙපාර්තමේන්තුවේ විශ්වාසය වනු ඇත.	
iii.	2020 පෙබරවාරි 20 දිනැති ප්‍රධාන ඉංජිනේරු බස්නාහිර දකුණ විසින් උපදේශක ඇමතූ ලිපිය අනුව, slab, beams, columns, lift wall සඳහා අනුමැතියකින් තොරව වෙනත් වර්ගයක steel bars යොදා ගෙන තිබූ අතර ඒ වන විටත් හත්වන මහලෙහි කොන්ක්‍රීට් වැඩ අවසන් කොට තිබුණි. වැඩ කිරීම සඳහා සපයා ගෙන තිබූ අනුමැතිය සහිත 25mm bars ද විඛාදනය වූ පරණ තොගයක් බවට සඳහන් කර තිබුණි. අනුමැතියකින් තොර යකඩ කම්බි භාවිතා කර ඉදිකිරීම් කරනු ලබන ගොඩනැගිල්ලෙහි ප්‍රමිතිය හා පැවැත්ම පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.	කොන්ත්‍රාත් ගිවිසුම අනුව කොන්ත්‍රාත්තුවේ ඉංජිනේරු උපදේශකගේ උපදෙස් පරිදි අනුමත වර්ගයේ කම්බි භාවිතා කළ යුතු අතර. කොන්ත්‍රාත්තුවේ ව්‍යාපෘති කළමනාකරණය පමණක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලදි. ව්‍යාපෘතියේ ඉංජිනේරුගේ යුතුකම් නිසි පරිදි සිදු නොවන බව ව්‍යාපෘති කළමනාකරු ලෙස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව නිරීක්ෂණය කළ බැවින් අදාළ ලිපිය යොමු කර තිබුණි. හත්වන මහල දක්වා ඉදි කිරීම සඳහා ඉංජිනේරු විසින් සහතික කළ කම්බි කොන්ත්‍රාත්කරු විසින් භාවිතා කර තිබූ අතර හත්වන මහලෙන් ඉහළ මහල් සඳහා වෙනත් වර්ගයක කම්බි භාවිතා කිරීමට ආරම්භ කර තිබූ බැවින් එම ස්ථාන කොන්ක්‍රීට් කිරීමට පෙර අදාළ ලිපිය නිකුත් කර තිබූ කම්බි නිසි ප්‍රමිතියකින් යුතු බවට සහතික කර ගැනීම අදාළ ලිපියේ අරමුණ විය. වැඩ බිමෙහි පවත්වන ලද ව්‍යාපෘතිය සඳහා වූ මාසික රැස්වීමේදී අදාළ කම්බි වර්ගය නිසි ප්‍රමිතියකින් යුතු බැවින් භාවිතා කිරීමට අවසර ලබා දී ඇත. ඒ අනුව ඉංජිනේරු විසින් සහතික කරන ලද කම්බි පමණක් ගොඩනැගිල්ලේ සියළුම ස්ථාන සඳහා යොදා ගෙන ඇත. ගොඩනැගිල්ල ඉදිකිරීමේ ප්‍රමිතියේ බාල වීමක් සිදු වී නොමැත.	ප්‍රමිතිය පරීක්ෂා කරන ලද අනුමත වර්ගයේ යකඩ කම්බි භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.

4.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන විසින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පසුගිය වසර 04 ක කාලසීමාවක් තුළ පිරිනමන ලද රුපියල් මිලියන 1,282 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 03 ක් ඉටු කිරීමේ ප්‍රමාදයන් පැවති අතර ඉදිකිරීම් ප්‍රගතිය දුර්වල මට්ටමක පැවතුණි.	කණිෂ්ඨ පොලිස් නිලධාරින්ගේ නිල නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2019 අගෝස්තු 20 දින ආරම්භ කළද සේවාලාභී ආයතනය ව්‍යාපෘතියේ විෂයය පථය ව්‍යාපෘතිය ප්‍රදානය කර ඉන්පසු ආරම්භයේදීම වෙනස් කිරීමට උත්සාහ ගැනීම, උපදේශක ආයතනය වෙත ශ්‍රී ලංකා පොලීසිය මඟින් ගෙවීම් කිරීම ප්‍රමාද වීම නිසා උපදේශකයකු නොමැති වීම, වසංගතය හා ආර්ථික අවපාතය මතද මඩු දේවස්ථානයේ සංක්‍රමණ නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2020 ජූලි	ඉදිකිරීම් ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව නිම කිරීමට කටයුතු කළ යුතු අතර ප්‍රමාදයන්ට හේතුවූ කරුණු සොයා බලා අදාළ නිවැරදිකිරීම් නොපමාව සිදු කළ යුතුය.

22 දින ආරම්භ කළද කොවිඩ් වසංගතය, ආර්ථික අවපාතය, සේවාදායක ආයතනය මඟින් ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසු සිදු කරන ලද විෂය පථය වෙනස් කිරීම වැනි කරුණු හේතු කොට ගෙනද මඩකළපුව මහජන පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වටිනාකම වූ රු.මි. 345 ක මුදලින් රු.මි. 200 ක් පමණක් මූලිකව ලැබුන අතර ඉතිරි මුදල නිසි කළට නොලැබීම හේතුවෙන්ද ව්‍යාපෘති වැඩ ප්‍රමාද වී ඇත.

4.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාරණ පනතේ 47(4) උප වගන්තිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 180 ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතු බවත්, 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10(02) ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(02) වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය සමඟ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2023 දක්වා කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත වී ඇති අතර 2024 කාර්යසාධන වාර්තාව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය වෙත භාර දී ඇත.	චක්‍රලේඛ විධිවිධාන පරිදි වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය සමඟ කාර්යයසාධන වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

4.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
i.	නුවරඑළිය සංචාරක බංගලාව පිහිටි ඉඩමේ කොටසක් අනවසර පුද්ගලයන් විසින් අත්පත් කරගෙන තිබුණ අතර එම ඉඩම මැනුම් කටයුතු සිදුකර හිමිකම් ඔප්පු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.	මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2024 නොවැම්බර් 08 දිනැති පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තුව හා මු.පි.නු. 2801 දරන පිඹුර ලබාගෙන ඇත. ඒ අනුව 2025 අප්‍රේල් 05 දින ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් විසින් නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශ ලේකම් මඟින් නිර්දේශ	ඉඩම් මැනුම් කටයුතු සිදුකර හිමිකම් ඔප්පු ලබා ගැනීමට හා අනවසර පුද්ගලයින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.

		සහිතව ප්‍රාදේශීය ලේකම් නුවරඑළිය වෙත ඉඩම පවරා දෙන ලෙස කරන ලද ඉල්ලීම අමාත්‍යාංශ ලේකම් විසින් 2025 අප්‍රේල් 28 දිනැතිව ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කර ඇත.	
ii.	දෙපාර්තමේන්තුව සතු දියතලාව ඉඩම ප්‍රාදේශීය ලේකම් විසින් පවරා ගෙන ඇති අතර ඒ වෙනුවට හපුතලේ ඉබ්බන්ආර ප්‍රදේශයේ ඉඩමක් ලබාදීමට නියමිත බව දැන්වූවත් ඔප්පු ලබාගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	හපුතලේ, ජයමිණිපුරගම ග්‍රාම නිලධාරි වසමේ ඉබ්බන්වැවපතන නමැති ඉඩම් කොටස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීම සම්බන්ධව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත හපුතලේ ප්‍රාදේශීය ලේකම් විසින් අවශ්‍ය නිර්දේශ යවා ඇති බැවින් පවරාදීම කඩිනම් කර දෙන ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත 2024 අගෝස්තු 27 දින ලිපියෙන් ඉල්ලා ඇත.	නිසි පරිදි ඔප්පු ලබා ගෙන අයිතිය තහවුරු කර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.

4.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**රජයේ නිලධාරින්ගේ හිඟ අත්තිකාරම් ශේෂ**		
i.	2017 සහ 2022 වර්ෂවලදී විශ්‍රාම ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අය විය යුතු රු.115,861 ක් හා රු.151,215 ක ණය ශේෂයක් අයකරගෙන නොතිබුණි.	කළමනාකරණ සේවා නිලධාරීගෙන් අයවිය යුතු රු.115,861 ක හිඟ ණය ශේෂය විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. විශ්‍රාම ගැන්වීමේ අනුමැතිය සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු කිරීම සඳහා නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. විශ්‍රාමික නිලධාරියා මරණයට පත්ව තිබුණු බැවින් අයවිය යුතු රු.151,215 ක ණය ශේෂය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යවා මරණ පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට උත්සහ දරමින් පවතී. නොඑසේනම් මෙම ණය මුදල රා.මු.චක්‍රලේඛ 01/2024 උපදෙස් අනුව භාණ්ඩාගාර අනුමැතිය මත කපා හැරීමට කටයුතු කරනු ඇත.	විශ්‍රාම ගිය නිලධාරින්ගේ හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.

ii.	2021 වර්ෂයේදී මිය ගිය නිලධාරියෙකුගෙන් වර්ෂ 04 කට වැඩි කාලයක් ගත වූ රු.226,987 ක ණය ශේෂයක් අයකර ගැනීමට පැවතුණි.	2021 වර්ෂයේ නිලධාරියා මියයන විට ඔහුගෙන් අයවිය යුතු ලෙස රු.226,987 ක හිඟ ණය ශේෂයක් තිබූ අතර අයකර ගැනීමට වෙනත් ක්‍රමයක් නොතිබුණු හෙයින් ඔහුගේ ඇපකරුගෙන් මාසිකව අයකර ගැනීමට කටයුතු කෙරුණි. ඒ අනුව මාසිකව අයකර ගන්නා ලද ණය මුදලෙහි 2024 දෙසැම්බර් 31 වන දින ශේෂය රු.144,488 ක් වන අතර 2025 මාර්තු 31 දින වන විට රු.136,998 ක් තවදුරටත් අයකර ගැනීමට ඇත.	ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි මිය ගිය නිලධාරීන්ගේ හිඟ ණය ශේෂයන් ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
iii.	2023 වර්ෂයේදී වැඩ තහනමට ලක්ව තිබූ නිලධාරියෙකුගෙන් රු.330,234 ක ණය ශේෂයක් අයකර ගැනීමට පැවතුණද එම ණය ශේෂය අය කර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.	වැඩ තහනමකට ලක්ව ඇති නිලධාරියෙකු විසින් ලබාගෙන ඇති ණය මුදල ගෙවන ලෙස කිහිප අවස්ථාවකම දැනුවත්කර ඇත. අයකරන කටයුත්ත අවසන්වී නොමැති බැවින් ඉදිරි ක්‍රියාමාර්ග සඳහා යොමුවීම ගැටළුකාරී තත්ත්වයක්ව ඇත.	පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට සුදුසු පියවර අනුගමනය කළ යුතුය.
(ආ)	කල්බදු ක්‍රමය යටතේ මිලදී ගැනීම්කර තිබූ වාහන 04 ක් කල්බදු කාලය අවසන්වී පැවතුණද දෙපාර්තමේන්තුවට අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.	කල්බදු ක්‍රමය යටතේ මිලදී ගත් වාහන සඳහා අයිතිය පවරාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	කඩිනමින් එම වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

5. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂය තුළදී 2030 වර්ෂය වන විට ලෝක බලශක්ති මූලාශ්‍රයන්හි පුනර්ජනනීය බලශක්ති කොටස ඉහල නැංවීම අරමුණු කරගෙන අලුතෙන් ඉදිකරනු ලබන හා නවීකරණය කරන රජයේ සියළුම ගොඩනැගිලි සූර්යය බලය උපයෝගී කර පුනර්ජනනීය බලශක්තිය	ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා රජය 2023 අවසන් කාර්තුවේදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි වටිනාකම රු.මිලියන 3,500 ක් පමණ වන ව්‍යාපෘතියක් මගින් රජයේ රෝහල් 46 ක සූර්ය පැනල සවිකිරීම සඳහා මූලික අධ්‍යයන කටයුතු ඇතුළු සැලසුම් සහ ලංසු ලේඛන සම්පූර්ණ කර ලබාදීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. මෙම ව්‍යාපෘතියේ ලංසු කැඳවීම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින්ම	තිරසර සංවර්ධන අරමුණු නිශ්චිතව හඳුනාගැනීමට හා ඒ අනුව ඉලක්ක හා නිර්ණායක සැකසීමට කටයුතු කළ යුතුය.

උත්පාදනය කරන පහසුකම් වලින් සමන්විතව ඒවායන්හි බලශක්ති අවශ්‍යතාවයෙන් සියයට 25 ක් සපුරා ගැනීම සඳහා පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක් ලෙස සූර්ය බලය උපයෝගි කර ගැනීම හා එමඟින් යෝජිත ගොඩනැගිල්ලේ බලශක්ති අවශ්‍යතාවයෙන් කොටසක් සපුරා ගැනීම පිළිබඳව සේවාදායක ආයතනය දැනුවත් කිරීම හා සූර්ය පැනල ස්ථාපිත කිරීමේ පහසුව හා ඉඩකඩ පුළුල් කිරීම, මූලික ගොඩනැගිලි සැලසුමෙහි අනිවාර්ය අංගයක් ලෙස නිර්ණායක සැකසීම හා රජයේ සියළුම ගොඩනැගිලිවල බලශක්ති අවශ්‍යතාවයෙන් යම් පංගුවක් සූර්යය බලය උපයෝගී කරගෙන සපුරා ගත යුතු බවට නීති රෙගුලාසි පැනවීමට මූලිකවම දායකවීම යන ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.	සිදු කිරීමට කටයුතු යෙදී තිබුණි. එහෙත් ව්‍යාපෘතිය ක්‍රියාත්මකවී නොමැත.

6. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට තනතුරු 154 ක පුරප්පාඩු පිරවීමට හෝ අවශ්‍යතාවයන්ට අනුව තනතුරු සංඛ්‍යාව සංශෝධනය කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.	ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු පවතින තනතුරු සඳහා එම පුරප්පාඩු පිරවීම සිදුකරන ලෙස දන්වමින් ඒ සම්බන්ධව දැනුම් දීම් සිදු කළ යුතු ආයතන වෙත දැනුම් දීම් සිදු කර ඇත. නමුත් මෙතෙක් අදාළ ආයතන වෙතින් පුරප්පාඩු සඳහා නිලධාරීන් අනුයුක්ත කොට නොමැති අතර ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු කිහිපයක් අවලංගු කර ඇත. එමෙන්ම නව කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/C/8/20/1 සහ 2012 අගෝස්තු 10 දිනැති ලිපිය මඟින් අනුමත කර ඇත. තවද අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක MUDH/HC/AD/103-1 හා 2025 මාර්තු 27 දිනැති ලිපිය අනුව මෙම දෙපාර්තමේන්තුවේ සේවා අවශ්‍යතාවය මත පිරවිය යුතු පුරප්පාඩු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත.	පුරප්පාඩු පිරවීමට හෝ අවශ්‍යතාවයන්ට අනුව තනතුරු සංඛ්‍යාව සංශෝධනය කර කාර්ය මණ්ඩලය කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතුය.